# 1.30 සුඛාත්ම නාටකය (Comedy) ඛේදාත්ම නාටකය (Tragedy) ට වඩා ඛේදනීය වේ.

ඉන්දික ෆර්ඩිනැන්ඩු
78, රතනජෝති මාවත, ගොඩිගමුව, රත්නපුර.
අනසූයා සුබසිංහ,
මහවත්ත පාර, හිඹුටාන.

## ABSTRACT

ලෝක නාට්‍ය ඉතිහාසයෙහි ප්‍රමුඛ නාට්‍ය ප්‍රභේද ද්විත්වය වන ඛේදාත්ම සහ සුඛාත්ම නාට්‍යයන්හි ඛේදය සහ විඳවීම (Suffering) පරිභාවිත වන ආකාරය මෙම පර්යේෂණයට පාදක වෙයි. මෙහිලා අපගේ තර්කය වන්නේ, ඛේදාත්මයෙහි (Tragedy) නිරූපිත ඛේදය සහ විඳවීමට වඩා සුඛාත්මයෙහි (Comedy) දී හාස්‍යය ප්‍රතිපාදනය කරනු වස් පරිභාවිත, එහි චරිත මුහුණ දෙන ඛේදය සහ විඳවීම බරපතල හා සංකීර්ණ බවයි. විඳවීම් ඛේදාත්මයෙහි ගාමක බලවේගය හෙවත් ජීවාත්මය වෙයි. අන් අයුරකින් පවසතොත් විඳවීම් යන්න ඛේදාත්මයෙන් උපන්, ඊට ආවේණික, එතුළ ස්වාභාවිකව ම පවතින, නෛසර්ගික ලක්‍ෂණයක් ලෙස ඓතිහාසික ව හඳුනා ගැනේ. සුඛාත්මයෙහි ද විඳවීම් ප්‍රමුඛ සාධකයක් වන මුත්, එය සුඛාත්මයෙහි ස්වාභාවිකව ම පවතින, නෛසර්ගික ලක්‍ෂණයක් ලෙස නාට්‍ය කලා ඉතිහාසය තුළ හඳුනාගෙන ඇත්තේ අතිශය දුර්ලභ ව ය. ඊට හේතු වී ඇත්තේ සුඛාත්මයක ඵලාගමයෙහි දී හෙවත් නාට්‍යයෙහි ගැටුම විසඳෙන අවසන් අවස්ථාවෙහිදී (Denouement) එහි විඳවීම අවසන් ව සියල් ප්‍රීතිජනක ව හා සැනසිලිදායක ව කෙලවර වන හෙයිනි. අවසානයේ දී පැමිණෙන ප්‍රහර්ෂය විසින්, ඊට පූර්වයෙන් පැවති සකල දුක්ඛ දෝමනස්සයන් අවධානයෙන් නෙරපා හරිනු ලබයි. විශේෂයෙන් ම සුඛාත්මයෙහි අන්තර්ගත විඳවීම හඳුනාගනු ලබන්නේ සුඛාත්මයෙහි චරිත මුහුණදෙන නෛසර්ගික වියවුල ලෙස මිස, විඳවීම් ලෙස නොවේ. අන් අයුරකින් පවසන්නේ නම් සුඛාත්මයෙහි ප්‍රමුඛ ලක්‍ෂණයක් වන, එහි චරිත මුහුණ දෙන වියවුල, අන් සියල්ල අබිබවා ඉස්මතු වීම හේතු කොට ගෙන, එකී වියවුල පුරා අරක් ගෙන සිටින විඳවීම හඳුනා නොගැනේ. එමෙන් ම එකී විඳවීම ප්‍රේක්‍ෂකයා වෙත ඉදිරිපත් කරන්නේ ඛේදාත්මක විඳවීමක් සඳහා නොව එහි ප්‍රතිවිරුද්ධ වින්දනය හෙවත් හාස්‍ය ජනනය සඳහා නිසා සුඛාත්මයෙහි චරිතවල විඳීම, විඳවීමක් ලෙස අර්ථකථනය නොවේ.

ඛේදාත්මයෙහි කථා නායකයා මුහුණ දෙන ඛේදය නිශ්චිත හා පැහැදිලි වෙයි. ග්‍රීක ඛේදාත්ම නාටක පාදක කොට ගෙන නිපන් ඇරිස්ටෝටලියානු කථා වින්‍යාසයට අනුව පහදන්නේ නම්, හේතුඵල වශයෙන් අතිශය තාර්කික ව එකිනෙක බැඳෙමින් ඒක රේඛීය ව ඉදිරියට ගමන් කරන සිදුවීම් මාලාව, කථානායකයාගේ දුඃඛ ප්‍රාප්තියත් සමඟ කෙලවර වෙයි. මෙනයින් ඛේදාත්ම කථා නායකයාගේ ඛේදය නිශ්චිත හා පැහැදිලි ද, ඒක රේඛීය ද, එහෙයින් ම නිර්සංකීර්ණ ද වෙයි. ඛේදාත්ම නාටකයෙහි දී එකිනෙක ගැටීමට සලස්වන සමාජීය සහ මානුෂීය ප්‍රබලතා සහ දුබලතා පැහැදිලි ව හඳුනාගත හැකි වීමත්, නිශ්චිත වීමත් ඉහත දක්වන ලද ඛේදයේ නිශ්චිත බව හා පැහැදිලි බව සඳහාත්, ඒක රේඛීය බව සඳහාත් බලපායි. එහෙත් සුඛාත්ම නාටකයෙහි චරිත මුහුණ දෙන ඛේදය මීට සාපේක්‍ෂව අතිශය සංකීර්ණ වෙයි. සුඛාත්ම නාටකයක සෑම විට ම ඊලඟට සිදුවන දෙය සඳහා විකල්ප රැසක් පවතින අතර ඒ නිසා සුඛාත්ම නාටකයේ චරිත මුහුණදෙන ඛේදය අවිනිශ්චිත ද, බහු රේඛීය ද වෙයි. මෙම සංකීර්ණ, නෛසර්ගික වියවුල විසින් එකී වියවුල තුළ සරන චරිතවල විඳවීම තමන් තුළ ගිල්වා සඟවාගනු ලබයි.

.